# කුට්ටම් පොකුණ





# වීරයෙකුගේ මරණය



**එකල විජේවීරලා දේශප්‍රේමීන් ලෙස ශරීරය දන්දෙන විට ජානක පෙරේරාලා දේශද්‍රෝහීන් ලෙස තම රාජකාරිය ඉටුකළේය. ජානක පෙරේරා ඝාතනය තවමත් අභිරහසකි. එය එල් ටී ටී යෙන් කළාවන්නට පුළුවන. නැත්නම් රජයේ අනුබලය ඇතිව කරුණාපිල කරා වන්නට පුළුවන. ඒ සැකය තවමත් මතුවන්නේ රජය මේ වනතෙක් මේ මරණය සම්බන්ධයෙන් පැහැදිලිව කිසිවක් නොකල නිසාය. ඒත් මේ සියල්ලටම ලොකුම වැරදිකාරයා වන්නේ රනිල්ය. ඒ භයානක මොහොතක ඔහුව දේශපාලනයට ගාවා ගත් නිසාය.**

දිවයිනේ හිටපු යුධ සෙන්පතියෙකු වූ ජානක පෙරේරා මහතාගේ අකල් මරණය පිලිබඳ කතාබහ උණුසුම දැන් කෙමෙන් දියවී යයි. දේශපාලඥයෙකු ලෙස බෝම්බයට බිලිවූ ඔහු අවසන් ගමන් ගියේ වීරයෙකු ලෙසය. චන්ද්‍රිකා බණ්ඩාරනායක සමය යටතේ හමුදාපති තනතුර හොබවන්නට ඔන්න මෙන්න කියා තිබියදී කැපිල්ලකට අසු වූ ඔහුට ඕස්ට්‍රේලියාවේ මහකොමසාරිස් තනතුර පිරිනමන්නට තරම් චන්ද්‍රිකා සොඳුරු විය. ඔහු මෙම තනතුරට පත්වන බව දැනගත් ඕස්ට්‍රේලියාවේ වෙසෙන දමිළ ජනයා මහා පරිමාණයේ උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කල බව ඔබ අප කවුරුත් දන්නා කරුණකි. ඒ ඔහු යුධ සෙන්පතියකු ලෙස උතුරේ සටනේද විශාල ගරිල්ලන් ප්‍රමාණයක් විනාශ කළ නිසාය. වැලිඔය සටනේදී ගරිල්ලන් තුන්සීයකට ආසන්න ප්‍රමාණයක් විනාශ කළ ඔහු එම සටන ජය ගත්තේ තමා වීරයකු ලෙස ඔප්පු කරමිනි. එහිදී මිය ගිය කොටි අයත් වූයේ කරුණා පිළටය. ඔවුන් බොහෝ දෙනෙක් නැගෙනහිර කොටිය.

මහ කොමසාරිස් තනතුර හොබවන සමයේ, ඔහු කොටින්ගේ ප්‍රචාරක ජාලා විනාශ කිරීමට මෙන්ම, සැබෑ මුහුනුවර ලෝකයාට පෙන්වීමට බොහෝ බොහෝ වෙහෙසක් ගත්තේය. ඔහු මෙරටට ඇවිත් දින දෙකතුනකින් ශ්‍රී ලාංකික ප්‍රජාව මුණගැසී කතා කළේය. එය සංවිධානය කළේ ස්කැටිස් සංවිධානයයි. එම අවස්ථාවට මාද සහභාගි විය. මෙරටදී එතරම් ජීවිත තර්ජනයක් නොමැති බව දැනගත් ඔහු ලාංකික ප්‍රජාවට මැදිවී සුහදව කතා කළේය. සියලුම ශ්‍රී ලාංකිකයෝ ඔහු සමඟ දොඩමළු වූයේ යුද්ධය පිළිබඳව දැනගැනීමටය. එහිදී ඔහු රාජ්‍ය තාන්ත්‍රික නිළධාරියෙකු වශයෙන් රජය ආරක්ෂා කරගෙන යුද්ධය පිළිබඳව කථා කිරීමට පරිස්සම් විය. මම සිටියේ ඔහුට පිටුපසින් කන් දීගෙනය. එකවරම පිටුපසට හැරුණු ඔහු තරමක් තිගැස්සිනි. එකල රැවුල වවාගෙන සිටි මා දුටු ඔහුට තරමක චකිතයක් ඇති වන්නට ඇත. පසුව මා සමඟ සුහදව සිනාසුණු ඔහු පිරිස ඇසූ ප්‍රශ්නවලට සුහදව පිලිතුරු දුන්නේය. එහිදී මාගේ මිතුරෙකුගේ බිරිඳක් ඔහුගෙන් මුහුණ සිප ගැනීමට අවසර ඉල්ලුවාය. තරමක් ලැජ්ජාශීලීව එයට අවසර දුන් ඔහු අනෙක් පිරිස සමඟ හඬින් සිනාසුනේය. වීරයෙකුගේ මුහුණක් සිපගැනීම පිළිබඳව ඇය මහත් අමන්දානන්දයට පත්ව සිටි ආකාරය මට තවමත් මතකය.

ජානක පෙරේරා ඕස්ට්‍රේලියාවේ මහකොමසාරිස් තනතුරෙන් ඉවත්කර මැලේසියාවේ තානාපතිකර යැව්වේද චන්ද්‍රිකාය. ඒ තමාගේ සමීපතම මිතුරකු වූද, ජනාධිපති ලේකම්වූද බාලපටබැඳිගේ මහතාට ඒ තනතුර පිරිනමන්නටය. අපි දන්නා තරමට ජානක පෙරේරා මහතා තදින් ක්‍රියාත්මක වන නිලධාරියෙකු වුවත් රජයේ දේපළ කාබාසිනියා කළ දූෂිත නිලධාරියෙකු නොවේ. ඒ නිසා ඔහුගේ ඇගේ දූෂිත මඩ නැත. ඔහු මැලේසියාවේ සිටියදීත්, කොටින්ගේ ආයුධ ප්‍රවාහන ජාලයට තිත තැබීමට කටයුතු කළේය. දැන් ඒ සියල්ල අතීතයට එකතු වී හමාරය.

ඊ ළඟට මතු වූ ප්‍රශ්ණය වන්නේ ජානක පෙරේරා මැරුවේ කව්ද යන්නයි. ඇත්තෙන්ම ජානක පෙරේරා දේශපාලනයට ආවේ නැත. කැඳවා ගත්තේය. නමුත් ඔහු එයට ආවේ වැරදි කාලයක හා අවාසනාවන්ත කාලයක් පසු කරන පක්ෂයකින්ය. වීරයෙක් වුවත් තම වීරකම වලංගු වන්නේ රජයට පක්ෂපාතීවනතුරු පමණි. දේශපාලනයට වීරයෙක් ද්‍රෝහියෙක් කිරීමටත්, ද්‍රෝහියෙක් වීරයෙක් කිරීමටත් පුළුවන.

කොටින්ට ජානක පෙරේරා අංක එකේ හතුරෙකි. ලකී අල්ගම සේම ජානක පෙරේරාද කොටීන්ගේ මරණ ලයිස්තුවේ මුලින්ම සිටියේය. මේ සියල්ල දැන දැනත් ජානක පෙරේරා ඔළුව දැම්මේ බලය නැති පක්ෂයකටය. තුන්වන ලෝකයේ රටවල දේශපාලන ක්‍රියාකාරකම් අනුව විපක්ෂයේ ලොක්කන්ට ලැබෙන්නේ අඩු ආරක්ෂාවකි. ඒ බව හමුදාවේ සේවය කළ ජානක පෙරේරාද හොඳින් දනී. යූ අන් පීයට බලය ලැබුනොත් ගෝඨාභයට, සරත් ෆොන්සේකාටද එසේමය. එහෙත් බංකොලොත් වී ඇති විපක්ෂ නායකයා තම බලය ගොඩනගා ගන්නට තෝරා ගත්තේ වීරයන් හා නළුවන්ය. එසේම ඔහු ජානකට දුන්නේද කොටින්ට සෙල්ලම් දාන්නට පහසුම නගරය වන අනුරාධපුරයයි. රටේ වාතාවරණය අනුව මොළය පාවිච්චි කරන නායකයෙකු නම් ජානක එන්නට ඇසුවත් ගන්නේ නැත. අතීතයෙන් ඒ සඳහා හොඳ පාඩම් රනිල්ට ගත හැක. ජානක පෙරේරාට මර උගුලක් ඇටවූයේ රනිල්ය. එසේම ජානක පෙරේරා ගැවසෙන රැස්වීම්වල ඔහු ගතකලේ බොහෝ පරිස්සමින් හා අඩු කාලයක්ය. එදා විපක්ෂ නායක කාර්යාලය විවෘත කරන දිනද පළාත් සියලුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කළත් එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්වත් උත්සවයට පැමිණියේ නැත. පැමිණියේ පළාත් සභාවල හා නගර සභා මන්ත්‍රීවරු දෙතුන් දෙනෙකු පමණි. ඒ ජානක පෙරේරාට මරණය අත ළඟ බව ඔවුන් හොඳාකාරවම දැන සිටි නිසාය. එසේනම් රනිල් කියන පරිදි ජානක පෙරේරා මැරුවේ ආණ්ඩුවෙන්ද? නැත. ඔහු මරාගෙන ඇත්තේ රනිල්මය.

එසේම එම ඝාතනය ඔහු කරුණා පිළට යැවීමටද බොහෝ උත්සහ කළේය. එයද අසාර්ථක විය. ජානක මැරුවේ මරාගෙන මැරෙන කොටියෙකු බව හොඳින් දැනගෙනත් රනිල් අසාර්ථක උත්සහයක යෙදී ජනතාවගේ අපවාදය ලබා ගත්තේය. සිංහල මරාගෙන මැරෙන බෝම්බ කරුවන් අපිට සිටියානම් ඒ සිටියේ හසලක ගාමිණී නැමැති යුධ සෙබළා පමණි. මා දන්නා තරමින් අපිට සිටින උතුම්ම වීරයා ඔහුය. මරණය ඔහු කරා ආවේ නැත. රට වෙනුවෙන් ඔහු මරණය සොයාගෙන ගොස් කඳවුර ආරක්ෂා කරගත්තේය.

කලකට ඉහතදී ජානක පෙරේරා අපේ රටේ දේශපාලනය ගැන කතා කළේ අප්‍රියාවකි. අපේ රටේ පවතින අපවිත්‍ර දූෂිත දේශපාලනයට තමා කිසි දිනක සම්බන්ධ නොවන බව ඔහු ප්‍රකාශ කළේ මාධ්‍යකරුවන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි. ඊටපසු එජාපයට සම්බන්ධ වී ඔහු ප්‍රකාශ කලේ, මේ පරාජිත දේශපාලනය තුරන් කිරීමට එජාපයට සම්බන්ධ වූ බවය. ශ්‍රීලනිපය මෙන්ම එජාපයද දූෂිත පක්ෂය. එසේනම් ඔහුට ඒ සඳහා සම්බන්ධ වීමට තිබුනේ ජනතා විමුක්ති පෙරමුණට හෝ වික්‍රමබාහුටය. එසේම යුධ සෙන්පතියෙක් ලෙස සිටි ඔහු මාධ්‍ය හමුවේ රජයේ යුධ ප්‍රතිපත්තිය විවේචනය කළේය. එහෙත් රටේ ජනතාව දෑස් දල්වාගෙන රජයේ යුද්ධය ගැන බලාපොරොත්තු තබාගෙන සිටින මොහොතක ඔහු එය විවේචනය කරමින් ජනතා විශ්වාසයද බිඳගත්තේය. විපක්ෂය කෙතරම් මහින්දට ඇඟිල්ල දික් කළත් රටේ ජනතාව අද එය විශ්වාස කරන්නේ නැත. තවමත් රජයේ බඹරය වැල්ලේ කැරකෙයි. ඒ නිසා බොරු ගොතන්නට පෙර රනිල් දෙවරක් සිතා බැලිය යුතුය.

රෝහණ විජේවීරගේ ඝාතනය සම්බන්ධයෙන් තමා නිර්දෝෂී බවත්, අත්ලේ ලේ පැල්ලම් තැවරී නැති බවත් ජානක පෙරේරා මහතා මෑතකදී ප්‍රකාශ කළේය. රෝහණ විජේවීර අල්ලාගෙන මහත්මයෙකුට මෙන් සළකා ඉහල නිලධාරීන්ට භාරදුන් බවත් ඊට එහා එම ඝාතනය ගැන තමා කිසිවක් නොදන්නා බවත් ඔහු මාධ්‍යට ප්‍රකාශ කළේය. අපි එය පිළිගනිමු. නමුත් ඒ ඝාතනයට සම්බන්ධ බොහෝ දෙනෙක් අද ජීවතුන් අතර නැත. ප්‍රේමදාස ජනාධිපති, ලකී අල්ගම, රංජන් විජේරත්න ආදී සියළුමදෙනා අද අප හැරදා ගොස්ය.

එකල විජේවීරලා දේශප්‍රේමීන් ලෙස ශරීරය දන්දෙන විට ජානක පෙරේරාලා දේශද්‍රෝහීන් ලෙස තම රාජකාරිය ඉටුකළේය. ජානක පෙරේරා ඝාතනය තවමත් අභිරහසකි. එය එල් ටී ටී යෙන් කළාවන්නට පුළුවන. නැත්නම් රජයේ අනුබලය ඇතිව කරුණාපිල කරා වන්නට පුළුවන. ඒ සැකය තවමත් මතුවන්නේ රජය මේ වනතෙක් මේ මරණය සම්බන්ධයෙන් පැහැදිලිව කිසිවක් නොකල නිසාය. ඒත් මේ සියල්ලටම ලොකුම වැරදිකාරයා වන්නේ රනිල්ය. ඒ භයානක මොහොතක ඔහුව දේශපාලනයට ගාවා ගත් නිසාය.

ජානක පෙරේරා නොමැරී තව කල් ජීවතුන් අතර සිටියානම් එජාපයේ ඉහළටම යාම කාටවත් වළක්වන්නට බැරිවන තරමට ඔහු පාක්ෂිකයන් අතර ජනප්‍රිය වී සිටියේය. මෙවැනි ආකර්ෂනීය චරිතයක අඩුපාඩුව අද එජාපයට හොඳින් දැනේ. ඒ අතින් ද එජාපය තවමත් අවාසනාවන්ත පක්ෂයකි.

කලින් කළ ලොව වීරයන් බිහිවේ. වීරයන් බිහිවීමට ද්‍රෝහියන් සිටිය යුතුය. ද්‍රෝහියන් නැති කිරීමට වීරයන් බිහිකළ යුතුය. නමුත් ද්‍රෝහියන් වීරයන් කිරීමටත් වීරයන් ද්‍රෝහියන් සහ කාඩ්බෝඩ් කිරීමටත් දේශපාලනයට පුළුවන. ඒ නිසා දේශපාලනයට සම්බන්ධවීමට පෙර වීරයන් ඒ ගැන දෙවරක් සිතිය යුතුය. ද්‍රෝහියන් පාර්ලිමේන්තුවට එනවිට දේශයෙන් සමුගනී.

මම මීට ඉහතදී ලංකාවේ ඉරිදා ලක්බිම මංජුසාවට සහ පහනට කෙටි කථාවක් ලිව්වෙමි. එහි නම වීරයාගේ නවාතැන් පොළයි. මෙය කියවන ඔබ එම කථාවද කියවා ඇතැයි මම සිතමි. එහි කථා තේමාවේ නායකයා අහිංසක යුධ සෙබළෙකි. මිය ගිය වීරයා සිහි කිරීමට තැනූ බස් නැවතුම් පොළක් ආශ්‍රයෙන් මම එය රචනා කළෙමි. එම තේමාව අනුව කථා නායකයා අහිංසක යුධ සෙබළෙකි. එම තේමාව ජානක පෙරේරා වැනි උසස් නිළධාරීන්ව සිටි වීරයන්ටද පොදු බව මට සිතෙන්නේ මෙවැනි දේවල් සිද්ධ වෙනවිටය. ඒ ඔහුගේ රූපරාමුද අද අව්වට වැස්සට දියවන නිසාය. තව ටික කලකින් ජානක පෙරේරාද අමතක වී යන වීරයන්ගේ ලැයිස්තුවට එකතුවනු ඇත.

මේ ආකාරයෙන් අවාසනාවන්ත ලෙස මරණයට ගොදුරු වන නායකයන්ට වට්ටක ජාතකයෙන් හොඳ පණිවිඩයක් ලබාදෙයි. වැද්දාගේ දැලට අසුවූ නායක වටුවා වැද්දාගේ මස් මඩුවෙන් බේරී ආවේ නායකකම සේම තම ජීවිතයද ආරක්ෂා කරගෙනය. තම නුවණ හරිහැටි යෙදවීම සේම ස්ථානෝචිත ප්‍රඥාව ඇති පුද්ගලයන්ට අතුරු අන්තරාවලින් ගැලවිය හැකි බව එම ජාතක කථාවෙන් මනාව ඔප්පු කොට ඇත.

**ලක්ෂමන් කොඩිතුවක්කු**


# GATEWAY LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila